දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය

Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ප්‍රථම භාග - 2015 හා 2019 (පුනර් 2015) පරීක්ෂණය - 2020 පෙබරවාරි/මාර්තු

Bachelor of Arts General (External) Degree Part I – 2015 & 2019 (2015 Repeat) Examination–February/March 2020

## දේවිසා 2.1 - දේශපාලන සමාජ න්‍යාය

## PSG 2.1 - Political and Social Theory

කාලය පැය තුන යි

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න**

**පැහැදිලි අත්අකුරෙන් පිළිතුරු සපයන්න**

---

01. "කිසියම් යුගයක දේශපාලන චින්තනය එම යුගයේ සමාජ, ආර්ථික සහ දේශපාලන වුවමනාවන් පිළිබිඹු කරයි." විමසන්න.

(ලකුණු 20)

02. "දේශපාලන සමාජ න්‍යාය දේශපාලන විද්‍යාවේ පදනම වේ." සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

03. "ප්ලේටෝ සහ ඇරිස්ටෝටල් යන දෙදෙනාම වඩා යහපත් රාජ්‍ය පාලනයක් බිහිකර ගැනීම සඳහා සංවිධිත අධ්‍යාපන ක්‍රමයක අවශ්‍යතාවය අවධාරණය කර ඇත." ඉහත ප්‍රකාශය විභාග කරන්න.

(ලකුණු 20)

04. "පරම බලැති පාලකයෙකු බිහිකර ගැනීමට තෝමස් හොබ්ස් උත්සාහ ගත් අතර, සීමිත බලැති පාලකයෙකු බිහිකර ගැනීම ජෝන් ලොක්ගේ උත්සාහය විය." සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

05. "මැකියාවලී වඩාත් සැළකිලිමත් වී ඇත්තේ දේශපාලන න්‍යායට වඩා ප්‍රායෝගික දේශපාලන ක්‍රීඩාව පිළිබඳවය." ඔබ එකඟ වන්නෙහි ද? හේතු දක්වන්න.

(ලකුණු 20)

06. "17, 18 සියවල්වල යුරෝපයේ නැගෙමින් ආ ධනපති පංතියේ දේශපාලන අදහස් ලිබරල්වාදය තුලින් ප්‍රකාශ වේ." විචාරාත්මකව පරීක්ෂා කරන්න.

(ලකුණු 20)

07. වී.අයි. ලෙනින්ගෙන් මාක්ස්වාදයේ වර්ධනයට සිදු වූ දායකත්වය අගයන්න.

(ලකුණු 20)

08. "මධ්‍යකාලීන යුගයේ දී ලෞකික රාජ්‍යයට වඩා ආගම ප්‍රබල විය." ශාන්ත ඔගස්ටීන්ගේ සහ ශාන්ත තෝමස් ඇක්වයිනාස් ගේ දේශපාලන අදහස් ඇසුරෙන් විමසන්න.

(ලකුණු 20)

09. "රාජ්‍යයේ ආරම්භය, වර්ධනය සහ අනාගතය පිළිබඳව කාල් මාක්ස් ඉදිරිපත් කළ අදහස් අනෙකුත් දේශපාලන චින්තකයින්ගෙන් වෙනස් වේ." අදහස් දක්වන්න.

(ලකුණු 20)

10. පහත සඳහන් මාතෘකා දෙකක් (02) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. ප්‍රජාතන්ත්‍රවාදය
ii. රෝම දේශපාලන චින්තනයේ සෙනකා සහ සියරෝ
iii. පැසිස්ට්වාදය
iv. බලතල බෙදීමේ න්‍යාය
v. ස්වාධිපතිවාදය

(එක් කොටසකට ලකුණු 10 බැගින් කොටස් 02 ට ලකුණු 20)

*******************************